# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,805 — 1959 ජූලි 10 වැනි සිකුරාදා — 10.7.1959

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# IV වැනි කොටස—පළාත් පාලනය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | 597 |
| තනතුරු—ඇබෑර්තු ... ... | 593 | අය-වැය ලේඛන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... | — | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 595 | මැංගී කොම්ට් දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... ... | — | විවිධ දැන්වීම් ... ... | 598 |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

1. **දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මේ දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් සඳහන් කොට නැති අවස්ථාවන්හි දී ආණ්ඩුවේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී, 1946 අංක 5 දරන පළාත් පාලන සේවා (සංක්‍රමණ විධිවිධාන) ආඥාපනතින් සංශෝධනය කරන ලද 1945 අංක 43 දරන පළාත් පාලන සේවා ආඥාපනතේ විධිවිධාන වලට ද 1945 අංක 43 දරන ආඥාපනත පිළිබඳ ව තවදුරටත් කෙරෙන සංශෝධනවලට ද ඒ ආඥාපනත යටතේ සාදනු ලබන රෙගුලාසිවලට ද එසේ ම කොමිෂන් සභාව විසින් කලින් කල නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසි වලට ද යටත් වන්නේ ය.

3. **සේවයට බාරගැනීම පිළිබඳ කොන්දේසි.**—1952 අගෝස්තු මස 8 වැනි දිනය හා 10,432 වැනි අංකය දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරන ලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අනිත් තනතුර ද ස්ත්‍රීන් නො වන පළාත් පාලන සේවා සාමාජිකයන් විසින් උසුලනු ලබද්දී, 1952 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේ ය.

(අ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා වල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මාරු කර හරිනු ලැබුවහොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ.

(ආ) ප්‍රාදේශික බල මණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හෝ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේ දී සේවයෙන් විශ්‍රාම ගැනීමේ දී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ, 1949 අංක 8 දරන පළාත් පාලන සේවා (සංශෝධන) පනතින් සංශෝධිත වූ 1945 අංක 43 දරන පළාත් පාලන සේවා ආඥාපනතේ 48 වැනි වගන්තියේ ප්‍රකාර, පළාත් පාලන සේවයට මාරු කරනු ලැබූ දිනයට ඉස්සරින් දා ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශික බල මණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුව ය.

(ඇ) ස්ත්‍රීන් ද, වයස 55ට වැඩි නිලධාරීන් ද පළාත් පාලන සේවයට පත් කරන ලද දිනයට ඉස්සරින් දා ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරූ නිලධාරීන් ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කෙරෙන සියලු දෙනාට ම, 1952 ජූනි 30 වැනි දිනය හා අංක 10,429 වැනි අංකය දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනාථ දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනාථ දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය වැටුපෙන් සියයට 4ක දායක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශික බලමණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ වැටුපෙන් සියයට 3 ක දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඈ) ප්‍රාදේශික බලමණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක්, මුදලින් හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරු වලට පත්වන්නන්ට නියම කළ හැකි ය.

(ඉ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනට ම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවයිනේ කවර පෙදෙසක වුව ද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(ඊ) අන්‍යාකාරයකින් නියම කොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම වර්ෂයක ආධුනික කාලයකට හෝ වර්ෂයකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(උ) අයදුම්කරුවන් විසින් ස්වකීය වයස තහවුරු කිරීම පිණිස උප්පැන්න සහතික පිටපත් අමුණා එවිය යුතුයි. දිවුරුම් පෙත්සම් නො පිළිගනු ලැබේ. උප්පැන්න සහතික පිටපත් අමුණා නැති කල්හි අයදුම්කරුවෝ සුදුසුකම් නැත්තවුන් ලෙස සලකනු ලැබෙති.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින් ම, තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතු ය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම් සම්බන්ධ සියලුම කටයුතු සඳහා "ලාංකික" යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූ වෙකි.

5. **යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම ආකාරයකින් ම සුදුසුකම් ලැබ සිටින මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූ අයට ද, සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහාජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි සිය කැමැත්තෙන් ම සේවයෙන් අස්වූවන් හැර සෑම කෙනෙකුටම ද, ඔව්හු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස, නො කඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දිනත්, ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනත් යන මෙදෑතුර තමන් එසේ සේවයේ යෙදී සිටි කාල පරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

6. **වයස පිළිබඳ අනුග්‍රහය.**—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා ම අයදුම්පත් එවීමට පළාත් පාලන සේවා සාමාජිකයන්ට පුළුවන.

7. ප්‍රසිද්ධ කොට ඇති තනතුරෙහි පන්තියට හා ශ්‍රේණියට ම අයත් වන තනතුරු උසුලන පළාත් පාලන සේවා සාමාජිකයන්ට අධ්‍යාපන සුදුසුකම් නො තකා, පළ කොට ඇති ඇබෑර්තුවට මාරු වී යාම සඳහා අයදුම් පත් එවිය හැකි ය.

8. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත් තම තමන් සේවය කරන ප්‍රාදේශික බලමණ්ඩලයේ සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයෙහි ස්ථිර තනතුරු දරන නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරා ගනු ලැබුව හොත් ඔවුන් ස්වකීය තනතුරු වලින් මුදාහරින්ට තමන් සූදානම් ව සිටිත් ද නැද්දැයි සඳහන් කළ යුතු යි.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයන් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iv) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපෑවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම් පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම්, රාජකාර්යයෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) අයදුම් පත් වනාහි මීට යා කොට ඇති ආකෘතියට සාරානුකූලව පිළියෙළ කොට පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අවසාන දිනට පසු මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ.

අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පතේ ආකෘතිය

**පළාත් පාලන සේවය**

..........................................**තනතුර සඳහා වූ අයදුම්පත යි**

(1) දැන්වීමේ සම්බන්ධය :————.

(2) සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

ජාතිය :————.

(ඉහත සඳහන් 4 වැනි කොන්දේසියේ අර්ථ නිරූපණය අනුව ලාංකිකයෙක් ද නැද්ද යනු සඳහන් කරනු)

(3) සම්පූර්ණ තැපැල් ලිපිනය :————.

(4) වයස හා උපන් දිනය :————.

(5) උපන් ස්ථානය—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) හෝ පිරවිය යුතුයි.)

(6) විවාහක ද අවිවාහක ද ? :————.

(7) අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය (දිනයත් සමග)—

(අ) ඉංග්‍රීසි :————.

(ආ) සිංහල/දෙමළ :————.

(8) ඉගෙන ගත් පාඨශාලාව සහ පාඨශාලාවෙන් අස්වූ දිනය : ————.

(9) (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා :————. (දිනයන් හා සේවය පිළිබඳ සම්පූර්ණ විස්තර ද සඳහන් කළ යුතුය.)

(ආ) මීට කලින් ආණ්ඩුව යටතේ සේවය කෙළේ නම් සේවය නතර කිරීමේ හේතුවත් සමග සේවය පිළිබඳ විස්තර සඳහන් කරන්න :————.

(ඇ) පළාත් පාලන සේවා සාමාජිකයෙක් නම්—

(i) දැනට දරන තනතුරේ නම සහ ශ්‍රේණිය :————.

(ii) දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) පළාත් පාලන මණ්ඩලවල සේවය පිළිබඳ වාර්තා සටහන :————.

(ඈ) සේවා මුක්ත භටයෙක් නම්—

සේනාංකය, තරාතිරම, සේවයට බැඳුණ දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

(10) සිංහල හා දෙමළ යන භාෂා කියවීම, ලිවීම හා භාෂණ පරිවර්තනය පිළිබඳ ප්‍රවීණතාව :————.

(11) විශේෂ සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————. (වෘත්තීය හා ශිල්පීය සුදුසුකම් ආදිය මෙනි)

(12) විශේෂ හිමිකම් ආදියක් ඇතොත් ඒ පිළිබඳ විස්තර : ————.

(අයදුම්කරු ඉල්ලුම්කරු සිටින තනතුර වැනි තනතුරක සේවය කිරීමෙන් ලබා ඇති පළපුරුද්ද මෙනි)

(13) තෝරා ගනු ලැබුවහොත්, බලාපොරොත්තු වන වැටුප : ————.

(14) චරිත සහතික ලබා ගෙන ඇති පුද්ගලයන්ගේ නම් සහ පදවි නාම :————.

(ඒ සහතිකවල මුල් ලිපි නොව ඒවායේ පිටපත් පමණක් ඇමිණිය යුතුයි)

(15) පළාත් පාලන සේවය යටතේ සේවය කෙළේ ද, එසේ නම් කිසියම් අවස්ථාවක සේවය නතර කරනු ලැබුවේද ? ————.

(16) කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

(17) ණයතුරුස් වලින් හෝ මුදල් කරදර වලින් නිදහස් ද : ————.

(18) ප්‍රධාන මුලාදෑනියාගෙන් හෝ ප්‍රාදේශීය ආදායම් නිලධාරියාගෙන් හෝ සමාදාන විනිශ්චයකාරයකුගෙන් හෝ දේවගැතිවරයකුගෙන් හෝ ලබාගත් පදිංචිය පිළිබඳ සහතික (පදිංචිය පිළිබඳ සහතිකයක් අවශ්‍ය වන අවස්ථාවල දී) : ————.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

## පළාත් පාලන සේවය

### පළාත් පාලන සේවයේ වින්නඹු සේවිකා තනතුරක්

පළාත් පාලන වින්නඹු සේවිකා සේවයේ පුරප්පාඩුවක් සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ. තෝරාගනු ලැබූ අයදුම්කරු පළමුවරට ගාල්ල නගර සභාවට පත් කරනු ලැබෙයි.

2. **වැටුප් ක්‍රමය.**—මේ තනතුරට අයත් වාර්ෂික වැටුප රුපියල් 666න් පටන් ගෙන, වර්ෂයකට රුපියල් 72 බැගින් 15 වරක් වැඩි වී රුපියල් 1,296 දක්වා නගී. එහි රුපියල් 1,086 වාර්ෂික වැටුපට ප්‍රථමයෙන් කාර්යක්ෂමතා කඩඉමක් ඇත්තේ ය.

3. **අවශ්‍ය සුදුසුකම්**—

(අ) වයස 59. 7. 24 දිනට වයස අවුරුදු 40ට නොවැඩි විය යුතුයි.

(ආ) ඉල්ලුම්කාරියෝ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකතුමාගෙන් ප්‍රවීණතාව පිළිබඳ සහතිකයක් දරන, ලියාපදිංචි වූ වින්නඹු සේවිකාවෝ විය යුත්තාහ. සෞඛ්‍ය මණ්ඩල වැඩ ගැන පළපුරුද්දක් ඇති, සිංහල හා දෙමළ කථා කළ හැකි අය ගැන විශේෂ සැලකිල්ල දක්වනු ලැබේ.

4. මේ ගැසට් පත්‍රයේ හතර වැනි කොටසේ ආරම්භයෙහි පළ කර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාලවන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම්පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට 1959.7.24 දිනට හෝ ඊට පළමු මා වෙත ලැබෙන ලෙස එවිය යුතුයි. සඳහන් කරන ලද ආකෘති පත්‍රයෙහි 19 වැනි ශීර්ෂය අත්හැරිය හැකිය. ඉල්ලුම්පත්‍ර එවිය යුත්තේ පහත අත්සන් කරන අයගේ පෞද්ගලික නමට නොව පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙතය.

6. ඉල්ලුම්පත්‍රවලට අමුනා එවිය යුත්තේ සහතිකවල පිටපත් මිස **මුල් ලිපි නොවේ.** පිටපත් අයදුම්කරුවන් වෙත ආපසු එවනු නො ලැබේ.

7. සියලුම ඉල්ලුම්පත්‍ර ලැබුනු බව දන්වා එවනු ලැබේ. යම්කිසි අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රය, ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට දින තුනක් ඇතුළත ලැබුණු බව දන්වා එවනු නොලැබුව හොත් වහාම ඒ බව පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්තුමා වෙත දැන්විය යුතුයි. මේ විධිවිධානයට අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත්, තම ඉල්ලුම් පත්‍රය සලකා බැලීම සඳහා ඇති යම්කිසි හිමිකමක් වෙයි නම් එය නැති වන්නේ ය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
සභාපති.

1959 ජූලි 6 වැනි දින,
තැ. පෙ. 530,
කොළඹ.

---

## අතුරු ව්‍යවස්ථා

ඇල්. ජී. සී—ජීසී 14/68.

### ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ උතුරු කලාගම් කෝරළේ ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව 1947ක් වූ සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශන යෙන් සංශෝධිත වූ එකී වගන්තියෙන් පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලය ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍ය
කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1959 ජූනි 30 වැනි දින,
කොළඹදීය.

#### අතුරු ව්‍යවස්ථාව

1. පහත දැක්වෙන කර්මාන්ත අන්තරායදායකවූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(1) කොප්පරා සෑදීම.
(2) කබුක් ගල්, බොරළු හෝ කළුගල් ලබා ගැනීමට ගල් වළවල් කැපීම.
(3) කපාපු පොල් වියලා සකස් කිරීම.
(4) කොප්පරා ගබඩා කිරීම.
(5) පිදුරු ගබඩා කිරීම.
(6) මීරන් වියලා සකස් කිරීම හෝ ගබඩා කිරීම.
(7) යන්ත්‍ර සූත්‍ර මාර්ගයෙන් හෝ සෙක්කුවෙන් පොල් තෙල් හිඳීම.
(8) පැඟිරි තෙල් හිඳීම.
(9) කෙඳි වර්ග තෙලීම හා ගබඩා කිරීම.
(10) කුරුඳු තෙල් හිඳීම.
(11) කපු පුළුන් නූල් ආදිය ගබඩා කිරීම.
(12) ලී මඩුවක් තබා ගැනීම.
(13) දර මඩුවක් තබා ගැනීම.
(14) ස්වර්ණාභරන සෑදීම.
(15) කම්හලක් තබා ගැනීම.
(16) භූමි තෙල් ගබඩාවක් තබා ගැනීම.
(17) මුද්‍රණ යන්ත්‍රාලයක් තබා ගැනීම.
(18) තේ කර්මාන්ත ශාලාවක් තබා ගැනීම.
(19) අම්ලකර වායුව යොදා ලෝකුරු වැඩ කිරීම.
(20) හාල් මෝලක් තබා ගැනීම.
(21) බයිසිකල් අලුත් වැඩියා කිරීම සඳහා වූ ස්ථානයක් තබා ගැනීම.
(22) මෝටර්රථ අළුත් වැඩියා කිරීම සඳහාවූ ස්ථානයක් තබා ගැනීම.
(23) ගෘහ භාණ්ඩ සෑදීම.

2. පහත දැක්වෙන කර්මාන්ත අප්‍රියවූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(1) ජාඩි හෝ කරවල ගබඩා කිරීම.
(2) තොග ගණනේ විකිණීම පිණිස නරක්වන සුලු ආහාර හෝ ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම.
(3) මිරිස් සහ වෙනත් තුනපහ වර්ග යන්ත්‍ර සූත්‍ර මාර්ගයෙන් ඇඹරීම.
(4) කොම්පෝස්ට් පොහොර හෝ කෘත්‍රිම පොහොර හෝ සෑදීම.
(5) විනාකිරි සෑදීම.
(6) සබන් සෑදීම.
(7) හම් පදම් කරන ස්ථානයක් තබා ගැනීම.
(8) පුවක් වියලා සකස් කිරීම.
(9) සතුන්ගේ ලේ හෝ මලකුණු උණු කිරීම.
(10) සතුන්ගේ හම් ගබඩා කිරීම.
(11) සතුන්ගේ ඇට කටු ගබඩා කිරීම.
(12) මාලු අයිස් දැමීම.
(13) ලැලි පොගවා සකස් කිරීම.
(14) රබර් ෂීට් හෝ ක්‍රේප් රබර් දුම් ගැස්වීම හෝ සෑදීම.
(15) කෘත්‍රිම පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීමට ගන්නා ද්‍රව්‍ය හෝ ගෝනි තුනකට වඩා ගබඩා කිරීම.
(16) සෝඩා සෑදීම.
(17) දුම්කොළ වියලා සකස් කිරීම.
(18) සුරුට්ටු සෑදීම.
(19) පැණි ගකුරු සෑදීම.
(20 රා එකතු කිරීමේ ස්ථානයක් තබා ගැනීම.
(21) බීඩි සෑදීම.

3. පහත දැක්වෙන කර්මාන්ත අන්තරාදායකවූද අප්‍රියවූද කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(1) කෙඳි සායම් කිරීම.
(2) ගඩොල් හෝ උළු පිළිස්සීම.
(3) බැටරි චාජ් කිරීම.
(4) හුණු ගල් පිච්චීම, ගබඩා කිරීම, සකස් කිරීම හෝ කුඩා කැබලි වලට කැඩීම.

ඇල්. ඩී.—ඩී. 132/46

ඇල්. ජී. ඩී.—ජීඅයි 11/13සී.

### ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදය) 49 වැනි වගන්තිය යටතේ, මහනුවර දිස්ත්‍රික්කයේ කුඳුකර පහළ ගම්ප්‍රදේශයේ ගම් කාර්ය සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර මස 24 වැනි දින අංක 9,773 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද ප්‍රකාශනයේ මඳක් වෙනස් කරන ලද එකී වගන්තියෙන් පළාත් පාලන සහ නිවාස සැපයීමේ කටයුතු පිළිබඳ ගරු ඇමතිණිය කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමිය විසින් අනුමත කරණ ලද අතුරු ව්‍යවස්ථාවයි.

වී. සී. ජයසූරිය
පළාත් පාලන සහ නිවාස සැපයීමේ කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1959 ජූනි මස 29 වැනි දින,

#### අතුරු ව්‍යවස්ථාව

"කුඳුකර පහළ ගම්කාර්ය සභාව විසින් සම්මත කරගන්නා ලද ආහාර ද්‍රව්‍ය විකිණීම පිළිබඳ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා, එහි 1, 2, හා 3 වැනි අතුරු ව්‍යවස්ථාවල ඒ එක් එක් අතුරු ව්‍යවස්ථාවේ "මස්" යන වචනය යෙදෙන සෑම ස්ථානයකම ඒ වචනය අස් කොට ඒ වෙනුවට "මස්, සහල්, තුනපහ" යන වචන යෙදීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ."

---

ඇල්. ජී. ඩී.—ජීසී 14/17.

### ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දුම්මලසූරිය ගම් ප්‍රදේශයේ ගම් කායසීසභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් මස 24 වැනි දිනය හා 9,773 වැනි අංකය දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් මඳක් සංශෝධනය කරන ලද එකී වගන්තියෙන් පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී ඇති බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1959 ජූනි මස 30 වැනි දින,
කොළඹදීය.

**රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථා**

1. (1) ආඥාපනතේ 47 වැනි වගන්තිය යටතේ අයකරනු ලබන රථවාහන හා සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන් ඒ බද්දට යටත් වූ යම් රථවාහනයක් හෝ සතෙකු අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන හෝ සිටින්නාවූ සෑම අයෙකු විසින්ම, සාමාන්‍යයෙන් මෙහි සඳහන් "ඒ" උප ලේඛනයෙහි සඳහන් පෝර්මයේ ප්‍රකාර විස්තර උප ලේඛනයක් ප්‍රධාන තුමාට සැපයිය යුතුයි. මේ පෝර්මය ගම් කායසී සභා කාර්යාලයෙන් ලබාගත හැකිය.

(2) ආඥාපනතේ 47 වැනි වගන්තිය යටතේ බද්ද ගෙවීමට බැඳී සිටින අය විසින්, 1959 වර්ෂය වෙනුවෙන් (1) වැනි ඡේදයේ සඳහන් කොට ඇති උප ලේඛනය සම්පූර්ණ කොට 1959 ජූලි මස 31 වැනි දින හෝ ඊට මත්තෙන් හෝ ප්‍රධානතුමා වෙත යැවිය යුතුයි. එකී අය විසින් ඒ වාහනය හෝ සතා හෝ අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන සිටින්නාවූ ඊට පසු මොනම අවුරුද්දක් වෙනුවෙන් වත් එකී අයගෙන් එබඳු උප ලේඛනයක් අවශ්‍ය නැත.

2. ආඥාපනතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධාන වලට යටත්ව 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උප ලේඛනය සැපයුවාවූ සෑම අයෙක්ම තව දුරටත් දැනුම්දීමක් දෙනු ලැබීමක් නැතිව—

(අ) උප ලේඛනයේ සඳහන් රථවාහන සහ සතුන් සඳහාවූ බද්ද, 1959 අවුරුද්ද වෙනුවෙන් ඒ අවුරුද්දේ අගෝස්තු මස තිස්එක් වැනිදා හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති. තවද,

(ආ) ඊට පසු එක් එක් වර්ෂය වෙනුවෙන් ඒ උප ලේඛනයේ සඳහන් කරන ලදුව, එකී වර්ෂයේ දවස් තිහකට වැඩි කාලයක් තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නාවූ එකී රථවාහන හා සතුන් සඳහාවූ බද්ද, එකී එක් එක් අවුරුද්දේ මාර්තු මස තිස් එක් වැනිදා හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති.

3. 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උප ලේඛනය සැපයුවාට පසු යම් කිසිවකු විසින් ඒ උප ලේඛනයේ සඳහන් නොකරන ලද්දාවූ ආඥාපනත යටතේ බද්දට යටත්වූද යම් රථවාහනයක් හෝ සතෙකු අත්පත් කරගෙන, තබාගෙන, හෝ පාවිච්චියට ගෙන තිබේ නම් හෝ 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් උප ලේඛනයක් සපයා නැත්තාවූ ඔහු විසින් එකී බද්දට යටත් යම් රථවාහනයක් හෝ සතෙකු පළමුවරට අත්පත් කරගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම්, එවිට ඒ අය විසින් එබඳු යම් රථවාහනයක් හෝ සතෙකු අත්පත් කර ගැනීමේ හෝ තබා ගැනීමේ හෝ පාවිච්චි කිරීමට පටන් ගැනීමේ දින සිට එක් මාසයක් ඇතුලත දී සාමාන්‍යයෙන් මෙහි පහත සඳහන් "ඒ" උපලේඛනයේ සඳහන් පෝර්මයේ ප්‍රකාරයට ලියවිල්ලකින් වූ දැන්වීමකින් එසේ අත්පත් කරගත් බව ප්‍රධානතුමාට දැනුම් දිය යුතුයි.

4. ආඥාපනතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධාන වලට යටත්ව, 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ දැන්වීම් සැපයුවා වූ සෑම අයෙක්ම, එකී ලේඛනය සැපයූ අවුරුද්ද වෙනුවෙන් හා ඊට පසු සෑම අවුරුද්දක් වෙනුවෙන්ද, එකී ලේඛනයේ සඳහන් කරනු ලැබ තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නාවූ රථවාහන හා සතුන් පිළිබඳ බද්ද. ඒ සඳහා ප්‍රධානතුමා විසින් තමාට දැනුම් දෙනු ලබන යම් කාල සීමාවක් ඇතුළතදී ගෙවීමට බැඳී සිටිති.

5. (1) 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උප ලේඛනය හෝ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින්වූ දැන්වීම හෝ සැපයුවාට පසු ඒ උප ලේඛනයට ඇතුළත් කළාවූ හෝ ලේඛනයේ සඳහන් කළාවූ හෝ යම් රථවාහනයක් හෝ සතෙකු සම්බන්ධයෙන් වූ බද්ද ගෙවීමට බැඳීමෙන් ආඥාපනතේ 47 (3) වැනි වගන්තිය යටතේ තමා නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින සෑම අයෙකු විසින්ම එසේ නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින්නේ අසවල් හේතු නිසා යයි දැක්වෙන ලියවිල්ලකින්වූ දැන්වීමක් වහාම ප්‍රධාන තුමා වෙත යැවිය යුතුයි.

(2) 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින්වූ දැන්වීම හෝ සැපයුවාට පසු ඒ රථවාහනය හෝ සතා තබා ගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළාවූ නොහොත් ඒ පිළිබඳ අයිතිවාසිකම් අත් හැරියාවූ සෑම අයෙකු විසින්ම ලියවිල්ලකින්වූ දැන්වීමකින්, තමා ඒ සතා හෝ රථවාහනය තබා ගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළ බව නොහොත් ඒ ගැන අයිතිවාසිකම් අත්හළ බව වහාම ප්‍රධාන තුමා වෙත ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

6. යම් කිසිවකු විසින් බද්ද ගෙවූ විට ප්‍රධාන තුමා විසින් ඒ බද්ද ගෙවූ රථවාහනය වෙනුවෙන් ඒ අයට මෙහි පහත සඳහන් "බී" උප ලේඛනයෙහි සඳහන් පෝර්මයේ ප්‍රකාරයට ඒ රථවාහන සඳහා වෙන් වෙන් වශයෙන් යොදා ඇති විශෙෂ අකුරුද, තහඩුව නිකුත් කරන අවුරුද්ද දැක්වෙන ඉලක්කම්ද, රථවාහන රෙජිස්ටරයේ ඒ ඒ රථවාහනය පිළිබඳවූ අංකයද හටහන් කොට ඇති තහඩුවක් නිකුත් කළ යුතුයි. එබඳු යම් තහඩුවක් පාවිච්චිය නිසා හෝ වෙනයම් ලෙසකින් හෝ නොපැහැදිලිව නොහොත් මැකී ගොස් තිබෙතොත් ඒ තහඩුව අයිතිකාරයා විසින් ප්‍රධාන තුමාට ආපසු භාර දිය යුතුයි. තවද ඔහු විසින් සත පණහක් ගෙවූ විට ඔහුට අළුත් තහඩුවක් නැවත ලබා ගැනීමට අයිතිවාසිකම් තිබේ. එබඳු යම් තහඩුවක් නැතිවී හෝ සොරාගෙන තිබෙන බව දිවුරුම් සහතිකයකින් හෝ වෙන යම් ලෙසකින් ප්‍රධාන තුමාට ඒත්තු ගැනීමට සෑලැස්සුව හොත් එතුමා විසින් අයිතිකාරයාගේ ඉල්ලීම පිටත් ඔහු විසින් සත හැටක් ගෙවනු ලැබූ විටත් අළුත් තහඩුවක් නිකුත් කළ හැකිය.

7. සෑම රථවාහනයක්ම අයිතිකරු විසින් හෝ භාරකරු විසින් 6 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ රථවාහනය වෙනුවෙන් නිකුත් කරන ලද තහඩුව ඒ රථවාහනයේ කාටත් පෙනෙන තැනක සවි කළ යුතුයි.

8. ප්‍රධාන තුමා විසින් හෝ ආදායම් හෝ ආදායම් ඕවර්සියර් වරයෙකු විසින් හෝ පොලිස් නිලධාරියෙකු විසින් හෝ ප්‍රධාන තුමාගෙන් ලියවිල්ලකින් බලය ලත් වෙනත් ඕනෑම නිලධාරියෙකු විසින් හෝ ඕනෑම මාවතක හෝ පාරක ගමනාගමනයෙහි යෙදී තිබෙන රථවාහනයක් හෝ රථවාහනයෙහි 7 වැනි අතුරු ව්‍යවස්ථාවේ ප්‍රකාර සවිකොට තිබිය යුතු තහඩුව පරීක්ෂාකර බැලීම පිණිස නවත්වා නතර කිරීම නීත්‍යානුකූල වන්නේ ය. තවද ප්‍රධානතුමා විසින් හෝ එකී නිලධාරියා විසින් ඉල්ලීමක් කර සිටි කල්හි එකී ඕනෑම රථයක භාරකාරයා විසින් හෝ රථය පදවන්නා විසින් හෝ රථය නවත්වා ප්‍රධාන තුමාට හෝ එකී නිලධාරියාට එකී තහඩුව පරීක්ෂා කර බැලීමට ඉඩ දිය යුතුයි.

9. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධානතුමා" යනුවෙන් කාර්‍ය සභාවේ ප්‍රධාන තුමා අදහස් කරනු ලැබේ;

"කාර්‍ය සභාව" යනුවෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ දුම්මලසූරිය ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව අදහස් කරනු ලැබේ;

"ආඥාපනත" යනුවෙන් ගම්සභා ආඥාපනත (198 වැනි පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ.

"ඒ" උපලේඛනය

**ෆෝර්මය**

අංකය :————.

ඡන්දදායක කොට්ඨාශ අංකය :————.

**දුම්මලසූරිය ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව**

රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන්වූ අතුරු ව්‍යවස්ථාවල ප්‍රකාරයට සැපයිය යුතු රථවාහන හා/*හෝ සතුන් පිළිබඳ ලේඛනයයි.

අයිතිකාරයාගේ නම :————.

ගම :————.

| රථවාහන හා/*හෝ සතුන් පිළිබඳ විස්තරය | ගණන (වචන වලින්) | වෙනත් විස්තර (බයිසිකලයක් නම් සාදන ලද අයගේ නොම්මරය සඳහන් කරනු) |
|---|---|---|
| කරත්ත, තිරික්කල හෝ ජින් රිකෂෝ කරත්ත හැර ඕනෑම අන්දමක වාහන ... | | |
| ගොන් දෙන්නා බඳින බර කරත්ත හෝ තිරික්කල ... | | |
| තනි ගොනා බඳින බරබාග හෝ තිරික්කල ... | | |
| ජින් රිකෂෝ කරත්ත ... | | |
| අත් කරත්ත ... | | |
| බයිසිකල් ... ... | | |
| අලි ... ... | | |
| අශ්වයෝ ... ... | | |
| අශ්වතරයෝ ... ... | | |
| බූරුවෝ ... ... | | |

මගේ දැනීමේ හැටියට ඉහත සඳහන් ලේඛනය නිවැරදි බව සහතික කරමි.

————,
අයිතිකරුගේ/*හෝ පාවිච්චි කරන්නාගේ අත්සන

දිනය :————. *නුවුවමනා වචන කපා දමනු

"බී" උපලේඛනය

**ෆෝර්මය**

සෑම ගොන් දෙන්නා බඳින බර කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... V.C.D.D.

සෑම තනිගොනා බඳින බරබාග කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... V.C.D.S.

සෑම ජින් රික්ෂෝ කරත්තයක් සඳහා ... V.C.D.R.

සෑම බයිසිකලයක් සඳහා ... ... V.C.D.B.

# ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ

## කෑගල්ල පළාත් ආණ්ඩු සභාව

### දේපල විකිණීම

1950 පළමුවෙනි කාර්තුවේ සිට 1955 දෙවෙනි කාර්තුව දක්වා ඇති කාර්තුවලට, මීට ඇඳා තිබෙන උප ලේඛනයේ සඳහන් කර ඇති දේපල වෙනුවෙන් ගෙවිය යුතුවූ පරිපනම් බදු නොගෙවා හිඟව තිබීම කරණකොට ගෙන, අල්වා තහනමට ගතයුතු චංචල දේපල නොමැති නිසා 1939 වර්ෂයේ අංක 61 දරණ පළාත් ආණ්ඩු සභා ආඥාපනතේ 183(1) දරණ කොටසින් කියවෙන පරිදි 1947 අංක 29 දරණ නාගරික සභා ආඥාපනතේ 252 වෙනි කොටස යටතේ මවිසින් නිකුත් කරන ලද වරෙන්තු පත්‍රයක බලය පිට අල්වා ගන්නා ලද, (1) බදුකුලී සහ ලාබද, (2) ලී දඬු සහ උපදින දේද, (3) ගෙවල් සෑදී තිබෙන ද්‍රව්‍යද සහ (4) පහත සඳහන්කර තිබෙන දේපලමද, අතරතුර කාලයේදී නියමිත ගාස්තු සහ බදු මුදල් නොගෙවනු ලැබුවහොත්, එහි සඳහන් දිනයන්හිදී පෙරවරු 10 පටන්, එම ස්ථානවලදීම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ:—

ඒ. කේ. පී. අප්පුසිංඤෝ,
සභාපති.

පළාත් ආණ්ඩු සභා කාර්‍යාලය,
කෑගල්ල, 28.6.59.

උපලේඛනය

**කොට්ඨාශ නො. 1**

**1959 අගෝස්තු මස 17 වෙනිද**

කඳුරුපොකුණ පාර : නො. 301/85.
මාතර පාර : නො. 251/387, 233B/260, 344/270.
මුස්ලිම් පාර : නො. (351B) 43/4, (351C) 43/5, 346/22.

**1959 අගෝස්තු මස 18 වෙනිද**

පල්ලිකුඩාව පාර: නො. (314) 15/19, 317C/17, (321B) 39/2, 320A/31, 360/C45.

**කොට්ඨාශ නො. 2**

**1959 අගෝස්තු මස 19 වෙනිද**

මාර්කට් පාර : නො. (172A) 105/5, (105) 94/1, 105/100.
ගර්සස් පාර : නො. 37/31.
මාතර පාර : නො. 187C/39, (275B, 275C) 191.

**කොට්ඨාශ නො. 3**

**1959 අගෝස්තු මස 20 වෙනිද**

බෙලිඅත්ත පාර : නො. (470A) 104/7, (486) 138/15, 495/172, (460B) 75/8, (513) 113/17.

ඉදිපොකුණගොඩ පාර: නො. 393/16, (509) 96/1, 502/122, 390A/17, (390) 51/4, (387) 51/14, (386) 51/15, (384) 51/25.

**1959 අගෝස්තු මස 21 වෙනිද**

මාතර පාර : නො. (380) 148/19, (375A) 148/16, (375A) 148/17, (371/375) 148/15, 215/96, 128.

ඇන්නපිටිය පාර: නො. (434) 11/22, 424A/32.

**කොට්ඨාශ නො. 5**

**1959 අගෝස්තු මස 24 වෙනිද**

මැදකැටිය පාත්: නො. 808/15, 61, (787) 61/6, (768) 71/5, (767) 71/6, (764) 75, (754) 36/1.

**1959 අගෝස්තු මස 25 වෙනිද**

හම්බන්තොට පාර : නො. (599) 114/4, 156, (828, 828A) 200/7, (824) 220/3, 814A/248, 56.

මැදකැටිය පාර : නො. 630B/8.

**1959 අගෝස්තු මස 26 වෙනිද**

ශ්‍රී දීපංකර පාර: නො. 980/21.

විජය පාර : නො. 634/39, (770A) 73/1, (773A) 75/8, 945/101, (948) 113/1.

විජය පැසේජ්. : නො. 567/11.

# විවිධ දැන්වීම්

## වැඋඩ ගම්කාර්ය සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත දක්වෙන උප ලේඛනයේ සඳහන් අය විසින් 1959 වර්ෂයට මස් පිණිස සතුන් මැරීමට හා මස් කඩ පවත්වාගෙන යාමට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත් ඒ අනුව බලපත්‍ර නිකුත්කිරීම ගැන වැඋඩ ගම්කාර්ය සභා ප්‍රදේශය තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධවීමට ඇති හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 14ක් ඇතුලතදී මා වෙත දැනුම්දියයුතු බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ 201 වැනි පරිච්ඡේදය 6 වෙනි වගන්තිය යටතේ දැනුම්දෙනු ලැබේ.

ආර්. ආර්. ඩබ්ලිව්. රාජපක්ෂ,
වැඋඩ ගම්කායර්‍ය සභාවේ සභාපති.

ගම්කාර්ය සභා කාර්යාලය,
වැඋඩ,
30. 6. 59.

#### උපලේඛනය

**අංකය : 1**

ඉල්ලුම්කරුගේ නම : ඇස්. ඇම්. ඊ. ඕ. ෂරීප්දීන් ; බලපත්‍රයේ විස්තර : ගවයින් මැරීමට හා මස් වෙළඳාමට ; ස්ථානය : පරගහදෙනිය.

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ හොරොම්බාව ගම්කායර්‍යසභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත දක්වෙන උප ලේඛනයේ නම් සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස්. විකිණීම පිණිස 1959 වර්ෂයට බලපත්‍ර යක් ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීමට විරුද්ධව කුරුණෑගල දිස්ත්‍රික්කයේ හොරොම්බාව ගම්කාර්ය සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණ නිසායයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටින සේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට 14 දිනක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ, 1947 අංක 44 දරණ ආඥපනතේ සංශෝධිත වූ අංක 6 දරණ වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය : ඒ. ඇල්. ඇම්. සේගු මුහම්මදු අලියාර්, සියඹලාගස් කොටුව—කටුපොත ; ස්ථානය ; සියඹලාගස් කොටුවේ මීගහමුල ඉඩමේ පිහිටි ගෙය ; වෙළඳාම : ගරක්මස් හා එළුමස් .

ඇම්. ඕ. නිමලසිංහ
හොරොම්බාව ගම්කාර්යසභාවේ වැඩ බලන සභාපති තැන.

1959 ජූනි මස 27 වන දින,
හොරොම්බාව ගම්කාර්යසභා කාර්යාලය,
ගොඩවෙල, කටුපොත.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.